# ගිම්හාන සුළඟ

## සාහිත සරතැස නිවන මද පවනකි

*ජගත් ජේ. එදිරිසිංහ ගේ ගිම්හාන සුළඟ නවකතාව පිළිබඳ රසික සූරියආරච්චි කරන විචාරය*

ඕස්ට්‍රේලියානු සිංහල සාහිත්‍යයක පිබිදීම ගැන සිත්ගන්නා සුළු කතිකාවක් මේ දිනවල පවතී. ඕස්ට්‍රේලියානු සිංහල සාහිත්‍යය යන නමින් අදහස් කෙරෙන්නේ, ඕස්ට්‍රේලියාවේ වෙසෙන්නන් විසින් සිංහල භාෂාවෙන් ලියා ප්‍රසිද්ධ කරන නවකතා, කෙටිකතා, පද්‍ය සහ වෙනත් නිර්මාණ කෘතීන් වේ. පසුගිය දිනක එස්.බී.එස් ගුවන් විදුලියෙන් තම අදහස් දැක්වූ සාහිත්‍ය විචාරකයකු වන ආචාර්ය විමල් දිසානායක පැවසූයේ, රටින් පිට වසන සිංහල ලේඛකයින් අතින් බිහිවෙන සිංහල සාහිත්‍ය නිර්මාණයන් ගෙන් සමන්විත වන විගාමික සිංහල සාහිත්‍යය, මේ වන විට ප්‍රධාන ප්‍රවාහයේ සිංහල සාහිත්‍යයේ එක් අංශයක් ලෙස සැලකිය හැකි තරමට වර්ධනයක් පෙන්වා ඇති බවයි. අපේ සැලකිල්ලට භාජනය වන ඕස්ට්‍රේලියානු සිංහල සාහිත්‍යය, මේ විගාමික සිංහල සාහිත්‍යයේ ම වැදගත් කොටසක් ලෙස අපි දකිමු.

ඕස්ට්‍රේලියානු සිංහල සාහිත්‍යයේ නියැලුණු ලේඛකයන්ට, ශ්‍රී ලංකාව කේන්ද්‍රස්ථානය වූ ප්‍රධාන ප්‍රවාහයේ සිංහල සාහිත්‍යයට, වඩාත් පුළුල් ලෙස දායක වීමට හැකිවන්නේ තම අළුත් වාස භූමියේ දී ලබන අත්දැකීම් මත පදනම් වූ සාහිත්‍ය නිර්මාණ බිහිකිරීමෙන් බව පැහැදිලි ය. එමගින් සිංහල සාහිත්‍යයට සුවිශේෂී පෝෂණයක් ද, සිංහල සාහිත්‍යකාමීන්ට නැවුම් රසාස්වාදනයක් ද ලැබෙනු ඇත.

දයාවංශ ජයකොඩි ප්‍රකාශනයක් ලෙස පසුගිය ද සිංහල සාහිත්‍යයට එක් වූ ජගත් ජේ. එදිරිසිංහ ගේ ගිම්හාන සුළඟ නවකතාව අපේ විචාරයට යොමු විය යුත්තේ මේ පසුබිමේ සිටයි.

අප බොහෝ දෙනෙකු දන්නා පරිදි, මෙල්බර්න් නුවර වාසී ජගත් ජේ. එදිරිසිංහ පුවත්පත් කලාවේදියෙකි; කවියෙකි; තීරු ලිපි රචකයෙකි; නවකතා කරුවෙකි; සාහිත්‍යධරයෙකි. පහන මාසික සඟරාව ආරම්භ කර එය ගොඩනැගීමට උර දුන් ඔහු පසුව සන්නස සඟරාව අරඹා අද එහි උපදේශක සංස්කාරක ලෙස කටයුතු කරයි. මේ සඟරා ද්විත්වයේ කොටස් වශයෙන් පළවුණු නවකතා කිහිපයක් ම ලියූ ජගත් ගේ ප්‍රකාශයට පත්වුනු දෙවන නවකතාව ගිම්හාන සුළඟ කෘතියයි. මීට අමතරව ඔහු කාව්‍ය සංග්‍රහයක් ද, කෙටි කතා පොතක් ද, අන්තර්ජාලය පිළිබඳ තාක්‍ෂණික ග්‍රන්ථයක් ද පළ කොට ඇත.

ගිම්හාන සුළඟ කතාව පහන සහ සන්නස සඟරාවල කොටස් වශයෙන් පළ වූ සමයේ එය අති මහත් රසික ප්‍රතිචාරයට ලක් විය. මෙයට මූලික හේතුව ලෙස මා දකින්නේ මේ නවකතාවට අනුභූතිය වී ඇති හද සසල කරවන කතා පුවතයි. ජගත් ජේ. එදිරිසිංහ නවකතාකරුවා අපට ඒ අන්තර්ගතය ඉදිරිපත් කරන්නේ ද මනරම් ආකෘතියක්, භාෂා විලාසයක් සහ උද්වේගකර සංසිද්ධීන් රැසක් උපයෝගී කරගෙන බව ද කිව යුතුය. කෙටියෙන් කිවහොත් ගිම්හාන සුළඟ නවකතාව සාර්ථක සාහිත්‍යමය නිර්මාණයකි.

ගිම්හාන සුළඟ නවකතාව, විශ්ව විද්‍යාල අධ්‍යාපනය හැදෑරීමට ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් නුවරට පැමිණෙන කෞශල්‍යා ධර්මවර්ධන නමැති තරුණිය ගේ ජීවිතය වටා ගෙතී ඇති දුක්ඛාන්තයකි. දෙමව්පියන් ගේ දික්කසාදය, තම මවගේ අළුත් සැමියා ගේ සල්ලාලකම, අළුත් රටක අළුත් පරිසරයක දී අරඹන තම විශ්ව විද්‍යාල ශිෂ්‍ය ජීවිතය, ඒ සමගම ඇරඹෙන තම නව යොවුන් නිදහස් ජීවිතය, ව්‍යාපාරික කටයුතු වලට කවදත් මුල් තැන දුන් තම පියා ගේ අළුත් දේශපාලන ගමන යනාදී ප්‍රශ්ණ රැසකට මැදිවන කෞෂල්‍යා ගේ ජීවිතය දුකෙන්, දෙම්නසෙන්, අභාග්‍යයටත්, ව්‍යවසනයන්ටත් පත්වෙන අයුරු ජගත් ජේ එදිරිසිංහ ගිම්හාන සුළඟ නව කතාවේ පාඨක හද බැද ගන්නා අයුරින් ගොනුකර කර තිබේ.

ගිම්හාන සුළඟ නවකතාව පිළිබඳ මේ විචාරය මූලික වශයෙන් අංශ තුනක් ඔස්සේ ඉදිරිපත් කිරීමට මම අදහස් කරමි.

මින් පළමුවැන්න නම්, ඕස්ට්‍රේලියාව වාස භූමිය කරගත් අපේ විගාමික සිංහල ජනකොටසේ ඉතා සුවිශේෂී උප කණ්ඩායමක් වන, ජාත්‍යන්තර ශිෂ්‍යයින් ලෙස මෙහි වාසය කරන තරුණ පිරිසේ ජීවිත පිළිබඳව ජගත් ඉදිරිපත් කරන විග්‍රහයයි. ඕස්ට්‍රේලියාවේ සිංහල ප්‍රජාව ගැන කතාකරන සෑම විටම පාහේ එයින් අදහස් කෙරෙන්නේ, අප ප්‍රජාවෙන් අතිමහත් බහුතරය වූ, වෘත්තීමය සංක්‍රමණිකයින් ලෙස මෙහි පැමිණෙන පිරිසයි. ජගත් ගේ ප්‍රථම නවකතාව වූ අසුර අඩවිය කෘතියේ කතාබහට ලක් වූ සරණාගතයින් ලෙස මෙහි පැමිණෙන පිරිසත්, පෙර කී ජාත්‍යන්තර ශිෂ්‍යයනුත් අපේ ප්‍රජාවේ ප්‍රමාණයෙන් සුළු වුවත් සුවිශේෂී උප කණ්ඩායම් වේ. මේ උප ප්‍රජා කණ්ඩායම්, විශේෂයෙන්ම අනාගත ඕස්ට්‍රේලියානු සිංහල ප්‍රජාවේ වැදගත් කාර්ය භාරයක් ඉටුකරනු ඇත. ප්‍රායෝගිකව බලතොත් තාවකාලික වූ මේ ජාත්‍යන්තර ශිෂ්‍ය උප ප්‍රජාවේ සංයුතිය, හැසිරීම් රටාව සහ ඔවුනට මුහුණ පාන්නට සිදුවෙන සුවිශේෂී අත්දැකීම් ගැන ගිම්හාන සුළඟ නවකතාවෙන් කෙරෙන සාකච්ඡාව ඉතා කාලෝචිත වන්නේ එහෙයිනි.

සිංහල ජාත්‍යන්තර ශිෂ්‍ය කණ්ඩායම තුල ලංකාවේ ව්‍යාපාරික, දේශපාලක මෙන්ම මධ්‍යම ප්‍රාන්තික පවුල්වල දරුවෝ වෙසෙති. ඔවුන්ගෙන් බහුතරයක් අනියම් කම්කරු රැකියාවල යෙදෙමින්, දුක් දෙම්නස් මැද සිය ඉගෙනීමේ කටයුතු ද යාන්තමට මෙන් කරගන්නා නමුත් සුළු පිරිසක් එවැනි මුදල් අඟ හිඟ කම් නොමැතිව සුඛිත මුදිත ජීවිත ගත කරන බව පෙනේ. ගිම්හාන සුළඟ නවකතාවේ එන ඉගෙනීම පසෙක දමා කකා බිබී ආරවුල් ඇතිකර ගනිමින් හැසිරෙන අශේන් නම් වූ ඇමැති පුත්‍රයා එවැන්නෙකි. යුද්ධ ආම්පන්න ජාවාරම්, රටේ සම්පත් වනසන "රොබර් බැරන්" ආකාරයේ ව්‍යාපාරික ගණුදෙනු වලින් සහ දේශපාලක පගා සහ කොමිස් වලින්, බොහෝ විට රුපියල් මිලියන් ගණනින් මැනෙන, කළු සල්ලි ලංකාවේ උපයෙන අයුරු අපි අසා ඇත්තෙමු. මේ කරුණු පරීක්‍ෂාකාරීව සලකා බලා නිගමනයන්ට ඒම යමෙකුට අපහසු නොවේ. ගිම්හාන සුළඟ නවකතාවෙන් මේ සම්බන්ධයෙන් කරන විග්‍රහය මතු දිනක ඓතිහාසික වශයෙන් ද ඉතා වැදගත් වෙනු ඇති බව මගේ වැටහීමයි.

ගිම්හාන සුළඟ නවකතාව කියවීමේ දී මගේ අවධානයට ලක්වුණු දෙවන කාරණය නම් මෙයින් නිරූපනය වෙන නව සමාජ ප්‍රවණතාවයන් ය. මේ සඳහා හොඳම උදහරණය වන්නේ කෞශල්‍යා ධර්මවර්ධන හා ඇගෙ අන්තර්ජාල මිතුරා වන විශ්ව අතර කෙරෙන සංවාදයන් වේ. පැරණි පෑනේ මිතුරු සම්ප්‍රදයේ අන්තර්ජාල වේෂය වන මේ මෙසෙන්ජර් හෙවත් පණිවුඩකරු සේවාව ඔස්සේ, ලෝකයේ දෙපස සිටින නාදුනන පුද්ගලයින් දෙදෙනෙකු තම අතිශය පෞද්ගලික තොරතුරු සහ සිතුම් පැතුම් යතුරු පුවරුව ඔස්සේ ක්‍ෂණයකින් හුවමාරු කරගන්නා අයුරුත්, එමගින් ඔවුන් අතර එක්තරා ආකාරයකින් අතාත්වික වූ සයිබර් සබඳතාවයක් ගොඩනැගෙන අයුරුත් මේ නවකතාවෙන් අපූරුවට නිරූපනය කොට ඇත. සිංහල නවකතාවක ප්‍රධාන කතා පුවතේ එක් මුලික පදනමක් ලෙස මෙලෙස අන්තර්ජාල සේවා පාවිච්චි කිරීමේ නව සමාජ ප්‍රවණතාවය උපයෝගී කර ගනු මා ප්‍රථම වතාවට දුටුවේ ගිම්හාන සුළඟ නවකතාවෙනි.

මෙයට අමතරව, තරුණ තරුණියන් විවාහ නොවී එකට ජීවත්වෙන :කසඩසබට එදටැඑයැර* නව සමාජ ප්‍රවණතාවය ද, පාඨකයා ගේ ස්වයං සාකච්ඡාව පිණිස ගිම්හාන සුළඟ නවකතාවේ පසුබිමෙන් ඉදිරිපත් කෙරේ. මෙය, අද කෙසේ වෙතත් නුදුරු අනාගතයේ දී සංක්‍රමණික ශ්‍රී ලාංකික දෙමව්පියන්ට මුහුණ දීමට සිදුවන ප්‍රශ්ණයක් බව මම සිතමි.

ජගත් ජේ. එදිරිසිංහ ගේ ගිම්හාන සුළඟ නිර්මාණය පිළිබඳව මා පාඨක අවධානය යොමු කිරීමට කැමති තෙවන කරුණ නම් දශක කීපයක් ඔස්සේ ශ්‍රී ලංකාව වෙලාගෙන පිළිලයක් ලෙසින් ඔඩු දුවමින් රටත්, එහි ආර්ථිකයත්, සාරධර්මත්, සංස්කෘතියත් විනාශ කරන දූෂිත පක්‍ෂ දේශපාලන කසල ගොඩ පිළිබඳව එයින් කෙරෙන හෙළිදරව්වයි. සම්පත් සුරා කෑම, ඥාති මිත්‍ර සේවනය සහ කොමිස් පගා ගැසීම අද ශ්‍රී ලංකා දේශපාලනයේ අනිවාර්ය කොටසක් බවට පත් වී තිබේ. මෙයින් පරිබාහිරව දේශපාලකයෙකුට පැවැත්මක් නැත. එවැන්නන් ඇත්නම් එක්කෝ ඔවුන් අන් අය හා එක්විය යුතුය; නැතහොත් ඒ යාන්ත්‍රණය මගින් නිරායාසයෙන් ම ඔවුන් ඉවත් කෙරෙනු ලැබේ. මේ කටුක සත්‍යය ගිම්හාන සුළඟ නවකතාවෙන් පාඨකයා ට ඉදිරිපත් කිරීම විශේෂයෙන් ම පැසසිය යුතු කරුණකි.

ගිම්හාන සුළඟ නවකතාවේ මා දකින ප්‍රධාන අඩුපාඩුව නම් මෙහි ප්‍රධාන චරිතය සහ තවත් චරිත කිහිපයක් ම අප අදහන අට ලෝ දහමෙන් එක් අඩකට, එනම් දුක ට, අලාභය ට, නින්දාව ට සහ අයස ට පමණක් භාජනය වීමයි. කරුණු එසේ මුත් මෙහි සඳහන් වෙන දූෂිත දේශපාලක ගුරුසිංහ ඇමති ද, ඔහුගේ හෙංචයියෙක් වන ජයසිරි ද කතාවේ අවසානය වනතුරුම යහතින් වෙසෙති. රචකයා මින් පෙන්නුම් කරන්නේ අද ලංකාවේ පවතින යථාර්තය බව නොරහසකි. එසේ වුවද, මෙය පාඨකයාගේ දැඩි දෝමනස්සයට හේතුවන බව කිවයුතු නොවේ.



ජගත් ජේ එදිරිසිංහ, කෞශල්‍යා ගේ කතාවේ දෙවන කොටසක් ලිවිය යුතු බව මට හිතෙන්නේ මේ නිසා ය. එය ද ගිම්හාන සුළඟ මෙන්ම අපේ සාහිත සරතැස නිවන මද පවනක් ම වේවා යැයි මම පතමි.

**රසික සූරියආරච්චි**

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243